පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නැටුම්

සතිය- 16 වන සතිය

10 ශ්‍රේණිය

Prepared by- දෙහිඕවිට අධ්‍යාපන කලාපය

## බෙර වාදනයට දැත හුරුකර ගනිමු.

- පෙර වර්ෂවල දී ඔබ උගත් බෙර/දවුල් සරඹ සහ බෙර/දවුල් පද වාදනය පාඩම ද උපකාර කර ගනිමින් පහත ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

01. 08 සහ 09 ශ්‍රේණිවල දී ඔබ උගත් බෙර සරඹ/දවුල් සරඹ තාල තබමින් කියන්න.
02. 08 සහ 09 ශ්‍රේණිවල දී ඔබ උගත් බෙර සරඹ/දවුල් සරඹ නිවැරදි ශිල්ප ක්‍රම අනුගමනය කරමින් විලම්භ හා මධ්‍ය ලයට අනුව වාදනය කර මතකය අළුත් කර ගන්න.
03. 09 ශ්‍රේණියේ දී ඔබ උගත් බෙර පද/දවුල් පද තාල තබමින් කියන්න.
04. 09 ශ්‍රේණියේ දී ඔබ උගත් බෙර පද/දවුල් පද නිවැරදි ශිල්ප ක්‍රම අනුගමනය කරමින් වාදනය කර මතකය අළුත් කර ගන්න.
05. අන්තර්ජාලය භාවිතයෙන් මාත්‍රා 2+3 තාල රූපයට අයත් බෙර පද/දවුල් පද වාදනය කරන වීඩියෝ පටයක් නරඹන්න. එය හොඳින් අධ්‍යයනය කරන්න.
06. අදාළ වීඩියෝ දර්ශන ගුරුකොට ගනිමින් නිවැරදි ශිල්ප අනුගමනය කර මාත්‍රා 2+3 තාල රූපයට අයත් බෙර පදය/දවුල් පදය වාදනය කරන්න.
07. අදාල බෙර සරඹ/දවුල් සරඹ සහ බෙර පද/දවුල් පද නැවත නැවත වාදනය කරමින් සතත අභ්‍යාසයේ යෙදෙන්න.
08. අදාල බෙර සරඹ/දවුල් සරඹ සහ බෙර පද/දවුල් පද මතකයෙන් වාදනය කිරීමට උත්සහ කරන්න.

- **මෙම පාඩමට අදාල බෙර/දවුල් සරඹ හා බෙර/දවුල් පද කොටස් enenapiyasa සාමාන්‍ය පාඩම් කොටසේ ඇතුලත් වේ.**
- **ඔබට බෙර වාදනය සඳහා බෙරයක් හෝ දවුලක් නොමැති නම් ඒ සඳහා ආදේශ/විකල්ප භාණ්ඩයක් යොදා ගන්න.**

ආර්.ඒ.මනුල රත්නායක

සම්පත් දායක